ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

# ශිල්ප කලා

## 10 ශ්‍රේණිය – 2019 – I වාර පරීක්ෂණය

### I කොටස

කාලය පැය 1

- **සියළුම ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**

1. විදේශිකයන්ගෙන් අප ලද දායාදයක් වුවත් දැනට ශ්‍රී ලංකේය අනන්‍යතාවයකින් යුත් ගෘහ කර්මාන්තයක් ලෙස කෙරෙන කර්මාන්තය වන්නේ,
   (1) පේෂ කර්මාන්තය (2) ලාක්ෂා කර්මාන්තය
   (3) බීරළු රේන්ද කර්මාන්තය (4) පිත්තල කර්මාන්තය
2. ශාන්ති කර්ම උදෙසා නිර්මාණය වූ ජනකලා කර්මාන්තය කුමක්ද?
   (1) පේෂ කර්මාන්තය (2) මැටි කර්මාන්තය
   (3) වෙස්මුහුණු කර්මාන්තය (4) ලාක්ෂා කර්මාන්තය
3. ශ්‍රව්‍ය හා දෘශ්‍ය කලා යන ප්‍රභේද දෙකට අන්තර්ගත ජන කලා නාට්‍යය වනුයේ,
   (1) වෙස්සන්තර ය (2) මනමේ ය (3) කාලගෝල ය (4) සොකරි ය
4. අපගේ ජාතික උරුමයක් වන ජන කලාව දෘශ්‍ය කලා, ශ්‍රව්‍ය කලා හා ශ්‍රව්‍ය දෘශ්‍ය යන පිළිවෙලට අයත් වන ජනකලා කාණ්ඩය වන්නේ,
   (1) ශාන්තිකර්ම, පේෂ කර්මාන්තය, පතල් කවි (2) වෙස්මුහුණු, ගොයම් කවි, සොකරි නාට්‍ය
   (3) පේෂ කර්මාන්තය, මැටි ශිල්ප, ලාක්ෂා කර්මාන්තය (4) ගොයම් කවි, ලී කැටයම්, කරත්ත කවි
5. ශ්‍රව්‍ය කලා කාණ්ඩයට අයත් වන්නේ,
   (1) කරත්ත කවි (2) මැටි කර්මාන්තය (3) වන්නම් (4) පිත්තල කර්මාන්තය
6. පාරම්පරික සුළු කර්මාන්තයක් වන ලාක්ෂා කර්මාන්තයේ දී ලාක්ෂා භාවිතා කර ඉතා සියුම් විසිතුරු සිත්තම යොදනු ලබන්නේ,
   (1) මැටි භාණ්ඩ වලටය (2) දැවමය භාණ්ඩවලටය
   (3) පිත්තල භාණ්ඩ වලටය (4) ස්වර්ණාභරණ වලටය
7. ලංකාවේ සිව්සැට කලාව ප්‍රභේද දෙකකට වර්ග කර ඇත. එනම්,
   (1) ශ්‍රව්‍ය කලාව හා දෘශ්‍ය කලාව (2) ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය දෘශ්‍ය කලාව
   (3) දෘශ්‍ය කලාව හා ශ්‍රව්‍ය දෘශ්‍ය කලාව (4) ජනකලාව හා විදග්ධ කලාව
8. වෙස් මුහුණු කර්මාන්තයට ප්‍රසිද්ධ ප්‍රදේශය වන්නේ,
   (1) මාතලේ හපුවිද ප්‍රදේශය (2) කැළණිය ප්‍රදේශය
   (3) අම්බලන්ගොඩ ප්‍රදේශය (4) කළුතර ප්‍රදේශය
9. අතීතයේ රජ මැදුරු අලංකරණයට හා පන්සල් ආශ්‍රිත නිර්මාණ මෙන්ම ප්‍රභූන්ගේ පරිහරණයට වඩාත් නැඹුරු වූ ජන කලා වර්ගය වන්නේ,
   (1) ලාක්ෂා (2) බීරළු (3) වෙස් මුහුණු (4) පැදුරු
10. අලංකාර රටා යොදමින් නිර්මාණය වන පන් පැදුරු කලාවේ අමුද්‍රව්‍ය ලෙස නොගන්නේ,
    (1) ගල්ලැහැ/ තුන්හිරියා (2) වැටකෙයියා / දුනුකෙයියා
    (3) පිහිඹියා / කැප්පෙටියා (4) තල් කොළ / ඉඳි කොළ
11. ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම සඳහා පැන්සල අත්‍යාවශ්‍යය උපකරණයකි. එනිසා ජ්‍යාමිතික ඇඳීම සඳහා වඩාත් සුදුසු පැන්සල් කාණ්ඩය වන්නේ,
    (1) 2H, HB, 2B (2) B, 2B, 2H (3) HB, B, 2B (4) H, B, 2H
12. වෘත්ත ආශ්‍රිත නිර්මාණයක් වන ඩේලියා මල නිර්මාණය සඳහා අවශ්‍ය පෙති ප්‍රමාණ සඳහා විකසන කීයක් අඳිනු ලබයි ද?
    (1) 02 (2) 03 (3) 04 (4) 05
13. කෝණ යනු සරල රේඛා දෙකක ශීර්ෂ දෙකක් එකට සම්බන්ධ වීමෙන් සෑදෙන්නෙකි. කෝණයේ අගය $90^0$ට වැඩි අංශක $180^0$ අඩු කෝණය හඳුන්වන්නේ,
    (1) සුළු කෝණය නමිනි (2) සෘජු කෝණය නමිනි
    (3) පරාවර්ථ කෝණය නමිනි (4) මහා කෝණය නමිනි
14. ජ්‍යාමිතික උපකරණ කට්ටලයට අයත් උපකරණයක් **නොවන්නේ** මින් කුමක්ද?

(1) කවකටුව (2) කෝණ මානය (3) ටී රූල (4) අඩි කෝදුව

15. මෙම රූප සටහනේ දැක්වෙන්නේ පහන් ආවරණයක් සැකසීම සඳහා සකස් කළ විකසනයකි. සේයා කරන ලද කොටස වෘත්තයෙන් ඉවත් කර ඇත. එම කොටස හඳුන්වන ජ්‍යාමිතික හැඩතලය කුමක්ද?




(1) ඒක කේන්ද්‍රික වෘත්තය (2) කේන්ද්‍රික ඛණ්ඩය

(3) වෘත්ත ඛණ්ඩය (4) අර්ධ වෘත්තය

16. සරල රේඛාවක් මත පිහිටි ලක්ෂ්‍යකට ලම්භකයක් ඇඳීම සඳහා පැන්සල සමඟ භාවිතා කළ යුතු අනෙකුත් ජ්‍යාමිතික උපකරණ මොනවාද?,

(1) කෝදුව හා කෝණමානය (2) කෝදුව හා කවකටුව

(3) කෝදුව හා විහිත චතුරස්‍රය (4) විහිත චතුරස්‍රය හා කෝණමානය

17. ජාත්‍යන්තර ප්‍රමිති සංවිධානය මගින් කඩදාසි සඳහා ප්‍රමාණ හඳුන්වා දී තිබේ. A4 ප්‍රමාණයේ කඩදාසියක මිනුම් වන්නේ,

(1) 841 x 1189 (2) 420 x 594 (3) 210 x 297 (4) 105 x 148

18. කෝණ තුනෙහි අගය අංශක $90^0$ ට අඩු පාද තුනම සමාන වූ ත්‍රිකෝණය වන්නේ,

(1) සුළු කෝණි ත්‍රිකෝණ (2) සමපාද ත්‍රිකෝණ (3) සෘජු කෝණි ත්‍රිකෝණ (4) මහා කෝණි ත්‍රිකෝණ

19. පාද 04 කින් සමන්විත වූ තල රූපය චතුරස්‍රය නමින් හඳුන්වයි. පාද හා කෝණවල අගය අසමාන සම්මුඛ පාද සමාන්තර නොවන චතුරස්‍රය හඳුන්වන්නේ,

(1) ආයත චතුරස්‍රය (2) සෘජුකෝණාස්‍රය (3) ත්‍රිපීසියම (4) සමචතුරස්‍රය

20. ජ්‍යාමිතික නිර්මාණයේ දී විවිධ රේඛා වර්ග භාවිතා කරනු ලබයි. රේඛා බෙදෙන ප්‍රධාන කොටස් 02 මොනවාද?

(1) වක්‍ර රේඛා/ ආනත රේඛා (2) සිරස් රේඛා / තිරස් රේඛා

(3) සරල රේඛා / වක්‍ර රේඛා (4) ආනත රේකා / සමාන්තර රේඛා

21. වස්තුවක පෙනෙන දාර දැක්වීම සඳහා භාවිතා කරනු ලබන සම්මත රේඛා වර්ගය වන්නේ,

(1) කඩ රේඛා (2) ඝන අඛණ්ඩ රේඛා (3) සිහින් අඛණ්ඩ රේඛා (4) සිහින් කඩ රේඛා

22. චාපයකින් හා ජ්‍යායෙන් අන්තර්ගත වූ කොටස හඳුන්වනු ලබන්නේ,

(1) කේන්ද්‍රික ඛණ්ඩය නමිනි (2) වෘත්ත පාද නමිනි

(3) වෘත්ත ඛන්ඩය නමිනි (4) අභිලම්භය නමිනි

23. සමචතුරස්‍රය යම්කිසි අගයක කෝණයකට ඇල කළ විට ලැබෙන රූපය වන්නේ,

(1) රොම්බසය (2) ත්‍රිපීසියම (3) රොම්බාභය (4) ආයත චතුරස්‍රය

24. පරාවර්ථ කෝණයෙහි අගය වන්නේ,

(1) අංශක $90^0$ ට වඩා අඩු (2) අංශක $180^0$ ට වැඩි

(3) අංශක $90^0$ (4) අංශක $90^0$ ට වැඩි අංශක $180^0$ ට අඩු

25. සංවෘත්ත තල රූපය බහු අස්‍ර ලෙස හඳුන්වයි. මින් බහුඅස්‍ර ගණයට අයත් **නොවන්නේ**,

(1) චතුරස්‍රය (2) පංචාස්‍රය (3) ත්‍රිකෝණය (4) සෘජුකෝණය

26. අතීතයේ දී වර්ණ සැකසීමට පරිසර සම්පත් යොදා ගෙන ඇත. ඒ අනුව කහ වර්ණය සකසා ගනු ලැබුවේ,

(1) මකුළු මැටි වලිනි (2) අඳුන් දැලි වලිනි (3) ගොකටු ගසේ කිරිවලිනි (4) නිල් අවරිය වලිනි

27. එක් වර්ණ ප්‍රභේදයකට සුදු හෝ කළු පැහැය එක් කිරීම තුලින් සකස් කර ගන්නා වර්ණ ප්‍රභේද වන්නේ,

(1) මොනෝක්‍රෝම් වර්ණ ප්‍රභේද (2) මූලික වර්ණ ප්‍රභේද

(3) ද්විතීක වර්ණ ප්‍රභේද (4) තෘතික වර්ණ ප්‍රභේද

28. ස්වභාවික අමුරෙදි වල පවතින දුඹුරු පැහැය ඉවත් කර සුදු පැහැය ලබා ගැනීම සඳහා සිදු කරන්නා වූ රසායනික ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,

(1) කැඳහරණය (2) මලහරණය (3) කාබණීකරණය (4) විරංජනය

29. රෙදිපිළි අලංකරණයට පෙර රෙදිවල ඇති කැඳ ඉවත් කිරීමට සිදුවේ. මේ සඳහා යොදාගත හැකි පහසුම ක්‍රමය කුමක්ද?

(1) ජලයේ පෙඟවීම (2) එන්සයිම යෙදීම

(3) අම්ල යෙදීම (4) ජලයේ පෙඟවීම හා එන්සයිම යෙදීම

30. පින්තාරු කලාවේ දී භාවිතා කෙරෙන පින්සල් අතුරෙන් විශාල ප්‍රදේශයක් පදාස ක්‍රමයට වර්ණ ගැන්වීම සඳහා සුදුසු වන පින්සල් වර්ගය කුමක්ද?

(1) නො.00-01 දක්වා වූ රවුම් පින්සල් ය (2) නො.02-04දක්වා වූ රවුම් පින්සල් ය
(3) නො.01-04 දක්වා වූ පැතලි පින්සල් ය (4) නො.08-10 දක්වා වූ පැතලි පින්සල් ය

31. වර්ණ ආලේප කිරීමේ දී දම් පැහැය අවශ්‍ය වූ විට ඒ සඳහා මිශ්‍ර කර ගත යුතු වන්නේ,
(1) රතු පැහැය හා නිල් පැහැය (2) නිල් පැහැය හා කහ පැහැය
(3) රතු පැහැය හා තැඹිලි පැහැය (4) කළු පැහැය හා රතු පැහැය

32. රෙදිපිළි වර්ණ ගැන්වීමට පළමු පෙර පිරියම් ක්‍රම මඟින් අපද්‍රව්‍ය ඉවත් කර ගැනීම කළ යුතු වේ. ප්‍රධාන පෙර පිරියම් කාණ්ඩය තෝරන්න.
(1) ක්ලෝරීකරණය / කාබනීකරණය / මැලියම්හරණය
(2) කාබනීකරණය / කැඳහරණය / මැලියම්හරණය
(3) කැඳහරණය / මලහරණය / විරංජනය
(4) මැලියම්හරණය / කැඳහරණය / විරංජනය

33. පින්තාරු කිරීමේ දී භාවිතා කෙරෙන 0,1 වැනි අංකන සහිත පින්සල් අවශ්‍ය වන්නේ,
(1) විශාල ප්‍රදේශයක් පදාස ක්‍රමයට වර්ණ ගැන්වීමටය
(2) විසිතුරු වාටි මෝස්තර ඇඳීමටය
(3) තරමක් විශාල මල් හා පළතුරු ආදිය වර්ණ ගැන්වීමටය
(4) මෝස්තරයක සියුම් රේඛා සහ ඉරි රේඛා ඇඳීමටය

34. කෘත්‍රිම ක්ෂාලක ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) බ්ලීච්න් පවුඩර් (2) සබන් (3) ප්ලාස්ටර් ඔෆ් පැරිස් (4) කෝස්ටික් සෝඩා

35. රෙදිපිළි අලංකරණය සඳහා භාවිතා කරන අච්චු මුද්‍රණ ක්‍රමය ප්‍රධාන වශයෙන් බෙදෙන කොටස් 2 ක් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) ස්වභාවික අච්චු හා කෘතිම අච්චු (2) ස්වභාවික අච්චු හා නිර්මිත අච්චු
(3) නිර්මිත අච්චු හා කෘත්‍රිම අච්චු (4) ස්වභාවික අච්චු හා තහඩු අච්චු

36. එක් මෝස්තරයක් භාවිතයෙන් එකම ප්‍රමාණයට හා එකම ආකාරයෙන් නිර්මාණ රාශියක් කර ගැනීමට භාවිතා කළ හැකි සරල ක්‍රමය වන්නේ,
(1) ස්ටෙන්සිල් ක්‍රමය (2) බතික් නිර්මාණ ක්‍රමය
(3) අතින් පින්තාරු ක්‍රමය (4) තාප බන්ධිත ක්‍රමය

37. ලෝම කෙඳිවල අපද්‍රව්‍ය ඉවත් කිරීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ කුමන නමින්ද?
(1) මැලියම්හරණය (2) කැඳහරණය (3) කාබනීකරණය (4) මලහරණය

38. සිදුරු තහඩු මඟින් මුද්‍රණය කිරීමේ දී සායම් ආලේප කළ හැකි ක්‍රමයක් නොවන්නේ,
(1) පින්සල් භාවිතයෙන් ආලේප කිරීම (2) ස්පොන්ච් කැබැල්ල භාවිතයෙන් ආලේප කිරීම
(3) ස්ප්‍රේ කිරීම මඟින් ආලේප කිරීම (4) සායම් ගිල්ලවීම මඟින් ආලේප කිරීම

39. අච්චු මුද්‍රණ ක්‍රියාවලියේ පියවර පහත දැක්වේ. එහි අනුපිළිවෙළ තෝරන්න.
A. රටාවක් ගොඩනැගෙන ලෙස මුද්‍රා තබා ගැනීම
B. සුදුසු මාධ්‍යයක මෝස්තරයක් ඇඳ ගැනීම
C. මුද්‍රණ තලයේ රෙදිකඩ සවිකර ගැනීම
D. අච්චු මුහුණතේ සායම් ආලේප කිරීම
E. කැපුම් තලයක ආධාරයෙන් මෝස්තරය කපා ගැනීම
(1) ABCDE (2) BCADE (3) BECDA (4) CBADE

40. රූපයෙන් දැක්වෙන්නේ පූජනීය ස්ථානයක උඩු වියනෙහි අලංකාරය සඳහා යොදා ගැනීමට හැකි පිච්ච මල් මෝස්තර ඒකකයකි. මෙම නිර්මාණය කිරීම සඳහා ආධාර කරගනු ලබන්නේ,
(1) කවකටුව පමණි (2) විහිත චතුරස්‍ර පමණි
(3) කෝණමානය හා කවකටුව පමණි (4) බෙදුම් කටුව හා කෝණමානය පමණි

## II කොටස

- **පළමුවන ප්‍රශ්ණය අනිවාර්ය වේ. පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

01. ශිල්ප කලා විෂය පාසල් හැරයන සිසුන්ට ස්වයං රැකියා අත්වැලක් සපයන බව අවබෝධ කරවීම සඳහා පා ගමනක් යාමට පාසලේ "ශිල්ප කලා කවය" අදහස් කරයි. ඉන් අනතුරුව විසිතුරු නිර්මාණ ප්‍රදර්ශනයක් හා අලෙවිසැලක් පැවැත්වීමට ද අපේක්ෂා කෙරේ.
    (1) පා ගමනේ දී ගෙන යාමට හරවත් නිර්මාණශීලි තේමා පාඨයක් ලියා දක්වන්න.
    (2) නිර්මාණ ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු භාණ්ඩ නිර්මාණය කළ හැකි පාරම්පරික කර්මාන්ත හතරක් ලියන්න.
    (3) එම කර්මාන්ත වලට අදාළව ප්‍රදර්ශනයට ඉදිරිපත් කළ හැකි පාරම්පරික කර්මාන්ත හතරක් ලියන්න.
    (4) උත්සවයට ඇරයුම් කිරීම සඳහා තනි පිටුවේ ආරාධනා පතක් නිර්මාණශීලිව සකස් කරන්න.
    (5) පා ගමනේ යෙදෙන අයට සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.
    (6) පා ගමනට සහභාගි වන කුළු නැටුම් කණ්ඩායමේ ගැහැණු ළමුන්ගේ ඇඳුමට පින්තාරු කිරීමට සුදුසු මෝස්තරයක් අඳින්න.
    (7) ප්‍රදර්ශනයට තැබීමට දේශීය ශාක කෙඳි භාවිතයෙන් කේක් ඇසුරුම් පෙට්ටියක් නිර්මාණය කළ යුතුව ඇත. ඒ සඳහා සුදුසු ශාක වර්ග දෙකක් නම් කරන්න.
    (8) උත්සව ශාලාවේ පිවිසුම් දොරටුව අභියස එලීමට කලාලයක් නිර්මාණය කිරීමට ගැළපෙන ජ්‍යාමිතික හැඩතල ඇඳ දක්වන්න.
    (9) උත්සව අවස්ථාවේ දී ආරාධිත අමුත්තා පිළිගැනීමට සුදුසු මල් සැකසුමක දළ සටහනක් අඳින්න.
    (10) නිර්මාණ ප්‍රදර්ශනයේ ජයග්‍රාහකයින්ට ත්‍යාග ප්‍රදානය කිරීමට අදහස් කර ඇත. එම ත්‍යාග ඇතුළත් කිරීමට සැකසු ඇසුරුම් පෙට්ටියේ රූපීය පෙනුම පහත දැක්වේ. මෙහි විකසනය දළ රූප සටහනකින් දක්වන්න



(1කට ලකුණු 2 බැගින්

02. සායම් වර්ග භාවිතා කර රෙදිපිළි අලංකාර කර ගත හැකිය.
    i) එසේ රෙදිපිළි වර්ණ කිරීමට යොදා ගන්නා අලංකරණ ක්‍රම 4 ක් ලියන්න. (ල:2)
    ii) එමඟින් අලංකාර කර ගනිමින් භාවිතයට ගත හැකි රෙදිපිළි නිර්මාණ 4 ක් ලියන්න. (ල:2)
    iii) අච්චු මුද්‍රණයට යොදා ගන්නා අච්චු වර්ග කීයද? ඒ මොනවාද? (ල:3)
    iv) මුද්‍රණය සඳහා එදිනෙදා පරිසරයෙන් සොයා ගත හැකි අච්චු 3 ක් නම් කරන්න. (ල:3)
03. අච්චු මුද්‍රණය ක්‍රමයට වඩා පැතිරුණු විශාල මෝස්තර නිර්මාණයේ දී සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය භාවිතා කරයි.
    i) සිදුරු තහඩු මුද්‍රණයක් සැකසීමට යොදා ගත හැකි මාධ්‍ය 2 ක් නම් කරන්න. (ල:2)
    ii) සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය භාවිතයෙන් කොට්ට උරයකට සුදුසු මෝස්තරයක් ඇඳ දක්වන්න. (ල:3)
    iii) මෙම ක්‍රමය භාවිතයෙන් කොට්ට උරයක් අලංකාර කර ගන්නා අයුරු පියවර අනුව දක්වන්න. (ල:5)
04. නිෂ්පාදිත රෙදි වල ස්වභාවිකව හා බාහිරව එක් වූ අපද්‍රව්‍ය ඉවත් කිරීමට පෙර පිරියම් ක්‍රම යොදා ගැනේ.
    i) මලහරණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල:3)
    ii) සායම් ස්ථිර කිරීම සඳහා මහා පරිමාණ කර්මාන්ත ශාලාවල භාවිතා කරන පසු පිරියම් ක්‍රම 2 ක් නම් කරන්න. (ල:3)
    iii) කැඳහරණ ක්‍රියාවලිය සිදුකළ හැකි සරල ක්‍රමය පියවර අනුව දක්වන්න. (ල:4)
05. ජ්‍යාමිතික ඇඳීම රේඛා හා සංකේත රාශියකින් සමන්විත වූ විශ්ව භාෂාවක් ලෙස හැඳින්වේ.
    i) ජ්‍යාමිතික ඇඳීම බෙදෙන ප්‍රධාන කොටස් 2 ක නම් කරන්න. (ල:2)
    ii) ජ්‍යාමිතික උපකරණ කට්ටලයට අයත් උපකරණ 4 ක් නම් කරන්න. (ල:2)
    iii) රේඛා බෙදෙන ප්‍රධාන කොටස් කීයද? ඒ මොනවාද? (ල:3)
    iv) සෙන්ටිමීටර 6 ක් දිග සරල රේඛාවක් ඇඳ AB ලෙස නම් කර නිවැරදි ක්‍රමවේද භාවිතා කරමින් සමාන කොටස් 7 කට බෙදන්න. (ල:3)
06. කවකටුව හා පැන්සල භාවිතා කරමින් වෘත්ත ආශ්‍රිතව විවිධ ජ්‍යාමිතික නිර්මාණ සිදු කරනු ලබයි.
    i) වෘත්තය යන්න අර්ථ දක්වන්න. (ල:2)
    ii) වෘත්තයක කොටස් 4 ක් ඇඳ නම් කරන්න. (ල:2)

iii) 50mm අරය ඇති වෘත්තයක් ඇඳ සමාන කොටස් 16 කට බෙදන්න. (ල:2)

iv) වෘත්තාකාර හැඩයට ඩේලියා මලක් නිර්මාණය කරන ආකාරය පැහැදිලි කරන්න. (ල:4)

07. සරල රේඛා දෙකක් ශීර්ෂ දෙකක් එකට සම්බන්ධ වීම නිසා කෝණ නිර්මාණය වේ.

i) කෝණ වර්ග 4 ක් ඇඳ නම් කරන්න. (ල:4)

ii) කවකටුව හා කෝදුව භාවිතයෙන් $60^0$ කෝණය නිර්මාණය කරන්න. (ල:2)

iii) අරය 30mm ඇති වෘත්තයක් ඇඳ සවිධි ෂඩස්‍රය නිර්මාණය කරන්න. (ල:3)

iv) බහුඅස්‍ර 02 ක් නම් කරන්න. (ල:1)